# අසනි

සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

2022 මැයි- ජූනි
47 වන කලාපය.
රු. 50/=

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කරන ලදි




ධනපති පංතියට
විකල්පය ලෙස
වාමාංශික පෙරමුණ
ගොඩනගමු..!

# රාජපක්ෂ ආණ්ඩුව

# කපෝති කරන සටන දිගටම..!

කිසිදු පාලකයෙකු මුහුණ නොදුන් ජනතා විරෝධයකට රාජපක්ෂ ගෝත්‍රික පාලනය මුහුණ දෙමින් සිටිති. ගෝඨාභය ජනාධිපතිවරයාගේ නිවස වටකිරීමත් සමඟ ඇති වූ විරෝධය මේ වන විට මුළු රටම වෙලා ගත් දැවැන්ත ජනතා නැගිටීමක් බවට පත්වී තිබේ.

මේ අරගලය සංඛේතවත් කරන මුලස්ථානය ලෙස ගාලු මුවදොර 'ගෝඨා ගෝ ගම' ප්‍රකාශයට පත් වී ඇත. සති ගණනාවක් ඉදිරියට ඇදෙමින් තිබෙන අධිෂ්ඨානශීලී අරගලය නිසා පීඩාවට පත්වී සිටින ජනතාවට එය බලවත් ආකර්ශණයක් වේ. දිනපතා ගොල්ෆේස් භූමියට එන ජනතාවගෙන් එය දකින්නට හැකි වේ. එමගින් ඇති කරනු ලැබූ බලපෑම නිසා බොහෝ ප්‍රදේශවල 'ගෝඨා ගෝ ගම' නමින් මධ්‍යස්ථාන ආරම්භ වී තිබේ.

රටපුරා මේ වන විට ජනතාව එක හඬින් කියා සිටින්නේ 'ගෝටා ගෝ හෝම්' පමණක් නොව රාජපක්ෂ පවුලම ගෙදර පලයල්ලා කියාය. ඔවුනට නිකම්ම යන්න නොදී නීතියට යටත් කළ යුතු බවද හඬගා කියා සිටිති. අවුරුදු ගණනාවක සිට පැවති රාජපක්ෂ පවුල් පාලනයේ අශික්ෂිත ක්‍රියා කලාපය නිසා ජනතා අප්‍රසාදයේ උච්චම අවස්ථාව වත්මන් අරගලය තුළින් විද්‍යාමාන වේ.

මේ අරගලය ජයග්‍රහණය කරා ඉදිරියට ගෙන යෑමට වැඩකරන ජනතාවගේ සහභාගීත්වය තීරණාත්මක වනු ඇත. පාලකයින්ගේ සමස්ත පැවැත්මට අභියෝග කළ හැක්කේ ද වැටුප සඳහා ශ්‍රමය වැයකරන පංතියට බව ඉතිහාසය විසින් ඔප්පු කර තිබේ. දැනටමත් වත්මන් අරගලය ජයග්‍රහණය දක්වා ඉදිරියට ගෙන යෑමට ඉදිරිපත් වී සිටින වෘත්තීය සමිති නායකත්වය විසින් සියළු වෘත්තීය සමිති නියෝජනය වන පරිදි වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින්ගේ ජාතික සමුළුවක් පැවැත්වීමට තීරණය කළ යුතුව තිබේ. එම සමුළුවේ දී අඛණ්ඩ මහා වැඩ වර්ජනයකට තීන්දුකරනු ලබන්නේ නම් රාජපක්ෂ පාලනය කපොති කළ හැකි බව අවධරණය කරමු.■



## මැයි දිනයේ

### සැබෑ ඓතිහාසික උරුමය රැකගනිමු..!

සියවසකට වඩා වැඩි කාලයක් ලෝක කම්කරු පංතිය මැයි දින සමරු රැස්වීම් හා පෙළපාලි පවත්වා තිබේ. ඉතිහාසයේ එම ගමන් මග තුළ අපි මේ වන විට සමරන 136 වැනි මැයි දිනය අන්තර් ජාතික කම්කරු පන්තියේ ජීවන පැවැත්මට තියුණු බලපෑම් එල්ලවන කාල පරිච්ඡේදයක් බව දක්නට ලැබේ.

ලෝක පරිමානව පසුගිය දශක තුනක කාලය තුළ ක්‍රියාවට නැගුණු නව ලිබරල්වාදී ආර්ථික පිළිවෙත මේ වන විට දැවැන්ත අර්බුදයක් කරා ගමන් කරමින් තිබේ. එම ආර්ථික පිළිවෙතේ අනාගතය ගැන ධනපති චින්තකයන් ප්‍රකාශ කරනු ලැබූ අනාවැකි මේ වන විට බිඳ වැටෙමින් තිබේ. නූතන නිදහස් ආර්ථික නමින් ක්‍රියාවට නැගුණු එම ආර්ථික පිළිවෙත කෝවිඩ් වසංගතය සමඟ තවත් තීව්‍ර වී තිබේ. එම අර්බුදය තුළින් මානව සංහතියට ඇතිවිය හැකි ප්‍රතිවිපාක බොහෝ භයානක විය හැකි බවට අනතුරු ඇඟවේ. මේ අරුබදය කොපමණ කාලයක් ඇදී යයිද ? එහි කෙළවර කුමක් ද ? යන කරුණු වලට ධනපති චින්තකයින්ට නිශ්චිත පිළිතුරක් නොමැත. එවන් අර්බුදයන් තුළ ලංකාව වැනි රටවල දේශීය ආර්ථිකයට ඇතිවිය හැකි ව්‍යසනය බොහෝ භයානක වී තිබේ. මෙම අර්බුදය හමුවේ ඇමරිකාව ප්‍රමුඛ යුරෝපයේ බොහෝ රටවල රැකියා අහිමි වන සංඛ්‍යාව මිලියන

8 වන පිටුවට

**ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය**

## එන්න අප හා එක්වන්න

නම :..............................................................................

ලිපිනය :.........................................................................

වයස :...................................

දුරකථන අංකය :..............................

ඊ මේල් ලිපිනය :...............................................................

495, මාකොළ උතුර මාකොළ. Tel 0777 0351 67





# ජවිපෙ උපත සහ වත්මන් දේශපාලන භාවිතය

## 1971 කැරැල්ලට වසර 51 ක් පිරීම නිමිත්තෙනි..

### 1971 කැරලිකාරී ව්‍යාපාරයට සම්බන්ධ ක්‍රියාකාරියකුගේ අත්දැකීම්

1971 සන්නද්ධ අරගලයට අඩ සියවසකුත් වසරක් සපිරේ. 1968 වසරේ පටන් ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ කාලීනයෙක් වශයෙන්, ක්‍රියාකාරී වූවෙක් වශයෙන් හා තවමත් නිර්ධන පංති කාර්‍යභාරය වෙනුවෙන් සහ මාක්ස්වාදායෙක් වශයෙන් අතීතාවලෝකනය කරමින් හැත්තෑ එකේ ඓතිහාසික යථාර්තය ඉස්මතු කිරීමට අදහස.

1971 අප්‍රේල් කැරැල්ල නැගිටීම සම්බන්ධයෙන්, විවිධ මතවාද සහ ධනේශ්වර චින්තකයන් අතින් ඕනෑ තරම් පත පොත බිහි වී ඇතත් ඒ සියල්ලම පාහේ සිදුවීම මාලාවක් ඉදිරිපත් කිරීමක් පමණක් ම හෝ හුදු මඩ ගැසීමක් පමණක් ම වී ඇතැයි යන්න සත්‍යයෙන් පරිබාහිර නොවේ. අවශ්‍ය වී ඇත්තේ සැබෑ විග්‍රහයක් කිරීමකට මුල පිරීම බව මාගේ අවංක අධ්‍යාංශයයි.

පන්ති සටන් ඉතිහාසය පුරාම මුළු ලොව පුරා සිදු වූ පන්ති ස්වරූපයේ එනම් පීඩිත පන්තිය, පීඩිතයාට එරෙහිව කළා වූ සියලු නැගී සිටීම් මාක්ස්වාදී කෝණයෙන් බැහැර කළ හැකි නොවේ. ස්පාටකස්ගේ පටන් අද දක්වා ම සිදු වූ සියලු අරගල ඓතිහාසික යථාර්තය තුළ ගැබ්ව ඇත. 71 අරගලයට ද එම නියාමය සාධනීය වේ.

#### ජනතා විමුක්ති පෙරමුණේ බිහි වීමට පාදක වූ ඓතිහාසික තත්ත්වය

1957 වර්ෂය වන විට සෝවියට් බෝලශේවික් පක්ෂයේ (කොමියුනිස්ට් පක්ෂය) කම්කරු පන්ති නායකත්වය ගිලිහී ගොස් නව ධනේෂ්වර පන්ති බලවේග හා නිලධාරී තන්ත්‍රයේ ජයග්‍රහනයට නතුව තිබූ අතර පක්ෂයේ 20 වන සම්මේලනයේ දී සාමකාමී සහජීවනය, සාමකාමී තරඟය සහ සාමකාමී සංක්‍රමණය යන ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්ති ඔසවා තැබුණු අතර 1961 හි 21 වන සම්මේලනයේ දී කූටප්‍රාප්ත විය.

එකී ප්‍රතිපත්තියට එරෙහිව චීනය නැගී සිටි අතර 60 වන දශකය පුරාම චීන - රුසියන් මත යැපීම උත්සන්න විය.

බොලීවියාවේ දී ආරම්භ කළ සන්නද්ධ ගරිල්ලා අරගලයේ දෝංකාරය ලොව පුරාම, විශේෂයෙන් ම ආසියා - අප්‍රිකා - ලතින් ඇමරිකා රටවල විප්ලවවාදී තරුණ කොටස් වලට අත වැනීමක් විය. වර්ෂ 1966 දී ඇමරිකන් සී අයි ඒ (CIA) ඔත්තු සේවාවෙන් මෙහෙයැවුණු බොලීවියන් හමුදාංකයකින් "චේ" ඝාතනය වූ පසුද මිය ගිය චේ ජීවත් වූ චේ ට වඩා ආකර්ෂණීය විය.

මේ වන විට ලංකාවේ වාමාංශික ව්‍යාපාරය කම්කරු පන්ති දර්ශනයෙන් පලා ගොස් ජරාජීර්ණව තිබිණි. ලංකා සම සමාජ පක්ෂය සහ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ධනපති සහභාග පාර්ලිමේන්තු දේශපාලන බලයේ රස උරමින් සිටියහ. වඩේ, තෝසේ උඩ දමමින් වර්ගවාදී සටන් පාඨ කියමින් පෙළපාලි යන තරමට පිරිහී සිටියහ. ධනේෂ්වර ආර්ථික අර්බුදය වඩාත් පහල මට්ටමකට ඇදී වැටෙමින් තිබූ මෙම අවධියේ අපේක්ෂා භංගත්වයකට පත්ව සිටි පීඩිත ජන කොටස්, විශේෂයෙන් ම රැකියා විරහිත තරුණ පිරිස්, විප්ලවීය මතවාදය වෙත නැඹුරු වීම අරුමයක් නොවන අතර, එය ඓතිහාසික වශයෙන් අනිවාරණීය වන සංසිද්ධියක් විය.

#### ජනතා විමුක්ති පෙරමුණ බිහි වීම

ඉහත කී ඓතිහාසික වර්ධනය හා මනෝමූල, විෂය මූල තත්ත්වයන් යටතේ, ලංකාවේ විප්ලවවාදී කණ්ඩායම් කීපයක් බිහි වූ අතර , ඒ සියල්ලම "සිංහල" වර්ගයා අතරින් වීම විශේෂත්වයකි. මේ වන විට උතුරේ "දෙමළ" තරුණ පිරිස් අතර ජාතිවාදී පදනමේ සටන්කාමී කණ්ඩායම් බිහි වීමේ මූලික බීජ රෝපණය වී තිබිණි. රුසියාවේ ලුමුම්බා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව හැදෑරීමට ගිය රෝහණ විජේවීර (නන්දසිරි විජේවීර) වසර තුනකට පසු ලංකාවට පැමිණියේ චීන - රුසියන් න්‍යායක අරගලයේ දී චීන මතවාදය දරමිනි. මේ හේතුව නිසා ම කොටාරෝඩිය රුසියන් හිතවාදී කොමියුනිස්ට් පක්ෂය ඔහුගේ උපාධිය සම්පූර්ණ කර ගැනීමට ආපසු යාමේ අයිතිය අහෝසි කළ බව ප්‍රකට කරුණකි.

ඉන් පසුව ඔහු දිගටම නාගලිංගම් ෂන්මුගදාසන්ගේ නායකත්වයෙන් වඩා සටන්කාමී ස්වරූපයකින් ක්‍රියාත්මක වූ කොමියුනිස්ට් පක්ෂය (චීන) පිලට සම්බන්ධ වී ක්‍රියාකාරන්නෙකු විය.

> ..පක්ෂයේ මුල සිටම පුද්ගල කම්කරු නියෝජනක් තිබූ නමුත්, වෘත්තීමය පූර්ණ කම්කරු පන්ති නියෝජනයක් වූයේ නැත. ඩී. ඒ. ගුණසේකර, ජේ. පී. පී. ධනපාල, දනෝරිස්, ප්‍රේමපාල හේවාබටගේ වැනි කම්කරුවන් පක්ෂ නායක මට්ටමේ සිටි නමුත් පසු කාලයේ දී බෝල්ෂේවික් මූලධර්ම මත පදනම් වූ ඉහළසිට පහළට ගොඩ නැගීමේ සංවිධාන පදනම දියාරු වී ගියේ ය. එය සිදු වූයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අතර සහ තරුණ පිරිස් අතරම විශේෂයනේම ග්‍රාමීය තරුණ බලවේග අතරම පක්ෂය ව්‍යාප්ත කරන්නට පටන් ගත පසුව ය..

ඒ අතරවාරයේ ඔහු වෙනම කණ්ඩායමක් ගොඩ නැගීමට උදවු වූයේ කොමියුනිස්ට් (චීන) පිලද විප්ලවවාදී වැඩ පිළිවෙලක් ඔස්සේ නොයාම නිසා ය. මේ අනුව මූලික වශයෙන් දොලොස් දෙනෙකුගෙන් යුක්ත ක්‍රියාකාරී කමිටුවක් සකස් කර රහසිගත ස්වරූපයේ දේශපාලනික වැඩ කිරීමට පටන් ගති.

පක්ෂයේ මුල සිටම පුද්ගල කම්කරු නියෝජනක් තිබූ නමුත්, වෘත්තීමය පූර්ණ කම්කරු පන්ති නියෝජනයක් වූයේ නැත. ඩී. ඒ. ගුණසේකර, ජේ. පී. පී. ධනපාල, දනෝරිස්, ප්‍රේමපාල හේවාබටගේ වැනි කම්කරුවන් පක්ෂ නායක මට්ටමේ සිටි නමුත් පසු කාලයේ දී බෝල්ෂේවික් මූලධර්ම මත පදනම් වූ ඉහළසිට පහළට ගොඩ නැගීමේ සංවිධාන පදනම දියාරු වී ගියේ ය. එය සිදු වූයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අතර සහ තරුණ පිරිස් අතරම විශේෂයනේම ග්‍රාමීය තරුණ බලවේග අතරම පක්ෂය ව්‍යාප්ත කරන්නට පටන් ගත පසුව ය. හැටේ දශකය අගදී පක්ෂය ජිමි ගණනාවක් ම පන්මින් ප්‍රමාණාත්මකව වර්ධනය විය.

#### පක්ෂයේ න්‍යාය, මතවාදී මූලධර්ම හා සංවිධානය

මුල සිටම පක්ෂ නායකත්වය පක්ෂ ක්‍රියාකාරීත්වයට මඟ පෙන්වන්නේ මාක්ස්වාදය බව ප්‍රකාශ කළ අතරම, එකී න්‍යාය ලංකාවේ සුවිශේෂී තත්ත්වයට ගැලපීම කළ යුතු බව මූලික දේශන වලදීම පෙන්වා දුනි.

එසේ නමුත් ජනතා විමුක්ති පෙරමුණ එකී මතයට දුන්නේ වෙනස් අර්ථ කථනයකි. එම අර්ථ කථනයට අනුව ඉන්දීය සම්භවයක් ඇති වතු කම්කරුවන් ඉන්දීය හිතවාදී මෙන්ම විප්ලවිය බලවේගයක් ලෙස වර්ධනය කළ නොහැකි මෙන් ම නොකළ යුතු බලවේගයකි. මෙහි යම් ප්‍රමාණයක වර්ගවාදී ගන්ධයක් පැවති බව සත්‍යයකි.

දෙවන කාරණය වන

6 වන පිටුවට

# අරගලය

## විජයග්‍රහණය දක්වා ඉදිරියට..




'ගෝඨා ගෝ හෝම්', නමින් ආරම්භ වූ අරගලයට රටේ සෑම පලාතකම ජනතාවගේ ආශිර්වාදය ලැබෙමින් පවතිනවා. මෙයින් පෙනී යන්නේ පවතින රාජපක්ෂ ගෝත්‍රික පාලනය පිළිබඳ ජනතාව අතර තිබෙන දැවැන්ත විරෝධයයි. එම විරෝධය සංකේතවත් කරන අති විශේෂ අවස්ථාවක් ලෙස මේ අරගලය ඉතිහාසයට එකතු වෙමින් තිබෙනවා. මේ අරගලයේ බලපෑම නිසා පාලකයින් අතර ප්‍රතිවිරෝධතාවයන් උග්‍රවෙලා. පාර්ලිමේන්තුවේ බහුතරය රාජපක්ෂ පාලනයට අහිමි වෙමින් තිබෙනවා.

ඉමක් කොනක් නොපෙනෙන මේ ඛේදවාචකය කරා රට ඇද දැමීමේ වගකීම පාලකයින් භාරගත යුතුයි. අද වනවිට පාලකයින් පඹගාලක පැටලිලා. මෙයින් ගොඩ ඒමට පාලකයින්ට පුලුවන් කමක් නෑ. දිනපතා ඉහළ යන ජීවන වියදම හමුවේ හිඟමනට වැටෙන ජනපිරිස වැඩි වෙමින් පවතිනවා. මේ දුක් විඳින මිනිසුන් පිළිබඳ පාලකයින්ට වගේ වගක් නැහැ. මුළු දවසට ගෑස් හා තෙල් පෝලිමේ සිටින ජනතාව අතර සමහර දෙනා එම පෝලිම්වලම මිය යන තැනට පත්වෙළා. මේ බොහෝ දෙනා දිනකට ගන්නේ එක ආහාර වේලයි. එම ආහාර වේලටද බතක් හා හොද්දක් උයන්නේ අතිශය අමාරුකම් මැද්දේ. දිනපතා විදුලිය කපාදැමීම ජනතාවට දරාගන්නට බැහැ. සියලු වැඩ කරන ජනතාවට තම ආයතන වල රැකියාව කරන පිරිසට මේ නිසා සිය රැකියාව කරගැනීමට නොහැකි වෙළා. මෙවන් පසුබිමක් තුල ආණ්ඩුවද එදා වේල සොයා ගැනීමට ඉන්දියාව, චීනය වැනි අසල්වාසී රටවලින් ඩොලර් ණය ලබාගැනිමට හිඟමනේ යනවා. එම ණය ලබාදෙන රටවල කෝන්දේසි කුමක් ද යන්න හෙළිදරව් කරන්නේ නැහැ. මේ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ගැනීමට ක්‍රියා කරන විට ඔවුන් කොන්දේසි පනවනවා. විශේෂයෙන් රාජ්‍ය අංශය, රාජ්‍ය ආයතනවල අනවශ්‍ය වියදම් කපාහැරීම වැනි සුබසාධන සේවා ලෙස පවතින සෞඛ්‍ය, අධ්‍යාපනය පුද්ගලික කරණය කරීම වැනි කොන්දේසි ද මේ සමඟම ඉදිරිපත් වීම නිසා පවතින ජන ජීවිතවල අර්බුදය තවත් තීව්‍ර වෙනවා.

මේ අතර විදේශ රටවලට යවන භාණ්ඩවලට කරන වියදම් අධික වී තිබෙනවා. වෙළෙඳ ශේෂ හඟවීම බරපතල ප්‍රශ්නයක් වෙලා. ඩොලරයේ මිල ඉහළ යාම නිසා විදේශ රටවලින් ගෙන්වනු සියලු භාණ්ඩවල මිල නොසිතූ විරූ ලෙස වැඩිවෙනවා. කන්ටේනර්වල විශාල භාණ්ඩ ප්‍රමාණයක් හිරවෙලා. මෙයට හේතුව ඩොලර් හිඟය බව පාලකයන් පවසනවා. රුපියල්වලට හිලව්වට ඩොලර් නිකුත් කිරීමට මහා බැංකුව අසමත්වීම මෙයට හේතුවේ. මේ නිසාම ආනයනික භාණ්ඩ හිඟයක් මතුවීම වැළැක්වීමට නොහැකි වෙලා.

මෙවන් සමාජ පසබිමක් තුල මැති ඇමතිවරු විදේශ සංචාර සඳහා රුපියල් කෝටි ගණන් වැය කරනවා. ඔවුනට ජනතාව මුහුණ දෙන මරණීය අභියෝග පිළිබඳ අනුකම්පාවක් නැහැ. මැති ඇමති වරප්‍රසාද කිසිවක් ඔවුන් අඩුකරන්නේ නෑ. මේ නිසා මතුවන ජනතා විරෝධය හා වෛරය වැඩිවෙමින් පවතිනවා. ජනතාවට වැදි බණ කියන පාලකයින්ට රැවටුන කාලය නිමවන හෝරාව පැමිණ තිබෙනවා.

මේ සමාජ පසුබිම තුල ආරක්ෂක අංශවල පවා බෙදීම් ඇති වෙමින් පවතිනවා. පොලිසියේ සේවයේ යෙදී සිටින බොහෝ දෙනා පාලකයින්ගේ නියෝග ක්‍රියාත්මක කිරීම නතර කරන දිනය වැඩි ඈතක නොවේ. පවත්නා පාලනය බිඳ වැටෙන බව ඔහුන්ට දැනීමත් සමඟ ජනතා අරගලයට ඔවුන්ගේ ආශිර්වාදය ලැබෙනවා.

මේ තත්ත්වය තුළ අරගලය විජයග්‍රහණය දක්වා ඉදිරියට ගෙනයාමට වැඩ කරන ජනතාවගේ සහභාගිත්වය තීරණාත්මක වෙනවා. වැටුප සඳහා ශ්‍රමය වැයකරන පංතිය මේ සටන සමඟ සම්බන්ධවීම මගින් පාලකයින්ගේ මළගම උදාකිරීමට හැකි වෙනවා.

මේ අරගලය ඉදිරියට ගෙනයාම සඳහා වෘත්තිය සමිති පක්ෂ භේදයකින් තොරව කටයුතු කළ යුතු වෙනවා. ඒ සඳහා වෘත්තිය සමිති ක්‍රියාකාරකයින්, ගොවි නියෝජිතයින් , සවිල් බුද්ධිමතුන් ඇතුළු පිරිසකගේ ජාතික නියෝජිත සමුළුවක් තුළ ප්‍රජාත්‍රන්ත්‍රවාදී සාකච්ඡාවක් මගින් අරගලය ජයග්‍රහණය කිරීමට අවශ්‍ය සංයුත්ත යෝජනා ඉදිරිපත් කරමින් තීන්දු ගැනීමට කටයුතු කළ යුතු වෙනවා. වත්මන් රාජපක්ෂ පවුල් පාලනය කම්මුතු කිරීම සඳහා වැඩකරන ජනතාවගේ නායකත්වයට අතිවිශාල වගකීමක් ඇති බව අපි අවධාරණය කරමු.

ඉතිහාසයේ දැවැන්ත ම අර්බුදයකට ධනපති පාලනය මේ වන විට මුහුණ දෙමින් සිටී. ඒ සඳහා ධනපති සීමාවන් තුළ පවා අවම විසදුමක් හෝ ලබා දීමට පාලකයින් අපොහොසත් වී තිබේ.

විදේශ ණය මත පවත්වාගෙන ගිය ඊනියා සංවර්ධන වැඩ පිළිවෙළ තව දුරටත් එසේ පවත්වාගෙන යන්නට නොහැකි වී තිබීම නිසා රජයට ලැබුණු සියලු ආදායම් මාර්ග අහිමිවීමේ අනතුරක් දක්නට හැක.

වසර ගණනාවක් ධනපති ආණ්ඩු විසින් උපයාගත් ආදායමට වඩා පාලකයින් වියදම් කර ඇති මුදල විශාල වීම නිසා ආර්ථික හිඟය පිරිමසා ගැනීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි මූල්‍ය ආයතනවලින් සහ විදේශ බැංකුවලින් මහා පරිමාණයෙන් ගත් ණය හා පොළිය නැවත ගෙවීමට නොහැකි වී ඇති අතර එම ණය ඇමරිකන් ඩොලර් බිලියන 2.4 කට වඩා වැඩි බව වාර්තා වේ. එකී තත්ත්වය තුළ රටේ බදුවලින් ලැබෙන ආදායමින් මෙම ණයවල පොළිය ගෙවන්නට වත් නොහැකි වන බව පෙනේ.

මෙවන් සමාජ පසුබිමක් තුළ නව ලිබරල් ගෝලීය ධනවාදී වැඩ පිළිවෙළ වෙනුවෙන් පෙනී සිටින වත්මන් ධනපති පාලනයට සහ රට ගිනිබත් කරන ආගමික ජාතිවාදී අන්තවාදය ප්‍රතික්ෂේප කිරීම සහ ධනපති හවුල් දේශපාලනයට එරෙහිව පෙනී සිටීම.

භාණ්ඩ හා සේවා මිල වැඩි කරමින් නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය විනාශ කිරීමට එරෙහිව පෙනී සිටීම.

ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා සංක්‍රමනික පියවරක් ලෙස උතුරු නැගෙනහිර කඳුකරය දකුණ ඒකාබද්ධව කම්කරු ගෞරී ජනතාව නියෝජනය වන පරිදි සභා ගොඩ නැගීම මේ මඟින් සියලු ජාතීන්ගේ ජාතික අභිලාෂයන් ආරක්ෂා කිරීම සඳහා ජාතික ප්‍රශ්නය විසඳීමට පෙනී සිටීම.

ගෝලීය ධනපති බලවතුන්ගෙන් රට නිදහස් කර ගැනීම සඳහා අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවලින් ලබාගත් ණය වහාම අහෝසි කර ඉන් ලැබෙන ප්‍රතිලාභ ජනතා සුභසිද්ධිය වෙනුවෙන් යෙදවීමට කටයුතු කිරිම.

වත්මන් ධනපති අර්බුධයට විකල්පයක් ලෙස සමාජවාදී වැඩ පිළිවෙලක් සමාජගත කිරීම සඳහා සියලු පීඩිත ජනතාව ගෙන යන සටන්වලට සහයෝගය ලබා දීම.

පවතින සමාජ ආර්ථික අර්බුදයට තිරසාර විසදුමක් ලබා දීම සඳහා ධනපති විරෝධී සමාජවාදී ආර්ථික වැඩ පිළිවෙළක් වෙනුවෙන් සියලු සමාජ බලවේග බලමුළු ගැන්වීමට පෙනී සිටීම.

අධිරාජ්‍යවාදී ගෝලීය බලවතුන්ගේ සියලු සමාගම් ජනසතු කරමින් කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ පරිපාලනය පදනම් කරලත් පාලන ව්‍යුහයක් ගොඩ නැගීම. ■

**ජනතා පීඩනයේ දෝංකාරය - මහින්ද දේවගේ /ප්‍රේමලාල් ජයවික්‍රම**

**ස්වාධීන ලංකා ගුරු සංගමය - සරත් කහගල්ල**

077 7035 167 | 077 9053 016 | 071 8949 884 | 070 3047 068 | 078 8426 191

# නව ලිබරල් මිත්‍යාව බිඳවැටේ.!

පි කතිකාවට බඳුන් කරන ලද "ලාංකේය කම්කරු පංති බලයන් සඳහා වූ ක්‍රියාකාරී ැලැස්මට ඇතුළත් කරන ගෝලීය ආර්ථික විග්‍රහයට (වෛෂික අවධාරනයට) පහත සඳහන් කරුණු සැලකිල්ල ගන්නා ලෙස අප පක්ෂයේ විධායක සභාව විසින් යෝජනා කිරීමට තීන්දු කරනු ලැබීය.පසුගිය මාර්තු 06 වනදා සාකච්ඡා කරනු ලැබූ බොහෝ කරුණු මෙහි අවධාරනය වී ඇතැයි සිතමු. ඔබගේ සටහනට පහත සඳහන් කරුණු ඇතුලත් කිරීම යෝග්‍ය යැයි සිතමු.

මහින්ද දේවගේ
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය

මෙම සියවසේ තුන්වන දශකය වන විට නව ලිබරල් වාදය පිළිබඳ අනාවැකි සහ පුරෝකථනයන් ඉදිරිපත් කළ ධනපති ලිබරල් චින්තකයන් ගේ සියලු අනාවැකි බිඳ වැටෙමින් තිබෙන බව පෙනේ. නව ලිබරල් ව්‍යාපෘතිය යනු නාගරික මිථ්‍යාවකි. නාගරික මනෝ රාජ්‍යයකි. අනාගතය සඳහා හොඳ ෆැන්ටසියක් එහි යෝජනා කරයි. මූල්‍ය ධනපතීන් ඇතුළු ප්‍රධාන ධනපති කොටස් හා මේ නව ලිබරල් වැඩපිළිවෙළේ නියමුවෝය. නිෂ්පාදනය පරිභෝජනය හා පොහොසත් වීම ඔවුන්ගේ සටන් පාඨ වී තිබේ.

මේ ආර්ථිකය වැඩපිළිවෙගට මානව සංහතිය මුහුණදෙන අර්බුදයට විසඳුම් ඉදිරිපත් කිරීමට නොහැකි ඇති බව පසුගිය දශක කීපය තුළ විද්‍යාමාන වෙමින් තිබුණි. මෙවන් තත්ත්වයක් තුළ 2007 - 2008 ගෝලීය ධනවාදයේ අර්බුදයෙන් ගොඩ ඒමට නොහැකි වී තිබූ ධනේශ්වර ක්‍රමයට 2019 වර්ෂයේ ඇති වූ වසංගත අර්බුදය නිසා එය තවත් උග්‍ර කරනු ලැබීය. මේ මගින් ඇති කරනු ලැබූ ආර්ථික අවපාතය 1929 ඇති වූ අර්බුදයටත් වඩා තීව්‍ර කර ඇති බව පෙනේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශ කළේ මේ මගින් ලෝක ආර්ථිකයට ඇති විය හැකි බලපෑම නිසා ඇමරිකාවට ඩොලර් ට්‍රිලියන 2.7 ක පාඩුවක් ඇති වී තිබෙන අතර ලෝක ආර්ථික වර්ධන වේගය සියයට 1.2 දක්වා පහළ වැටී ඇති බව ය. ලෝකයේ මිලියන 260 කට අධික ජනතාවක් ආහාර නොලැබීමේ අනතුරකට මුහුණ දෙමින් සිටින අතර ලෝකයේ විරැකියාවට පත් වී ඇති සංඛ්‍යාව මිලියන 11 කට ආසන්න වී ඇති බව ප්‍රකාශ කරති. ලෝක බැංකු වැනි මූල්‍ය ආයතනයන් පෙන්වා දෙන්නේ ලෝකයේ දුප්පත් කම එකවර ඉහළ ගියහොත් දිළිඳුතාවයට වැටෙන සංඛ්‍යාව ගණනය කරගැනීමට නොහැකි බවය. මේ මගින් අසාමානතාවය 2% කින් ඉහළ යාමද ආර්ථික වර්ධනය 8% පහළ යාමේ ප්‍රවණතාවයක් ඇතිවන බවයි. එය එලෙසින්ම සිදුවන්නේ නම් 2030 වසර වන විට දිනකට ඩොලර් 5.50 කට වඩා අඩුවෙන් උපයන දුප්පතුන් අතරට තවත් මිලියන 501 ක දෙනා එකතු වනු ඇති බවයි. කෙසේ වෙතත් ජනතාවගෙන් බිලියන 3.3 ක් දරිද්‍රතාවයට පත්වීම වැළැක්වීමට නොහැකි වනු ඇත.

ඉහත සමාජ පසුබිම තුළ මහා පරිමාණයෙන් තොරතුරු තාක්ෂණ සමාගම් පැහැදිලි ආධිපත්‍යයත් පිහිටුවා ගෙන ඇත. අති විශාල ආර්ථික පිරිහීම තිබියදී විශේෂයෙන් එක්සත් ජනපදයේ යුරෝපය හා ජපානයේ මූල්‍ය බුබුළු හට ගෙන ඇති අතර ඔවුන් අති මහත් ලාභ ලබමින් සිටිති. වසංගතය බරපතළ ලෙස නිෂ්පාදන ක්‍රියාවලිය බිඳ දමා ඇති අතර ප්‍රාග්ධනය ඒකරාශිකරණය අඩපණ වී ඇත. නමුත් වසංගතයට අදාළ සමහර ක්ෂේත්‍රයන් තුළ විශේෂයෙන් මහා පරිමාණ සන්නිවේදන ඊ - වෙළඳාම හා ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍ර තුළ සමාගම් අතිවිශාල ලාභ ලබා ඇත. මේ නිසා ලෝක ආර්ථිකය බරපතළ පිරිහීමක් දක්නට ලැබේ. ගත වූ දශක දෙක තුළ ප්‍රධාන ධනේශ්වර රටවල් වල ආර්ථික වර්ධනයන් සමග බැලූ විට චීනය පමණක් ආර්ථික වර්ධනය සැලකිය යුතු මට්ටමකින් ඉහළ දමා ගෙන ඇත.

එසේම 2021 දී එක්සත් ජනපදය හා යුරෝපය යම් ආර්ථික වර්ධනයක් අපේක්ෂා කළත් සමාජය තුළ ආසාමානතාවය බරපතල ලෙස ඉහළ ගොස් ඇත. වැඩ කරන ජනතාවගේ රැකියා අහිමි වී ඇත. ආදායම් විශාල ලෙස පහත වැටී ඇත. මෙම සෞඛ්‍ය හා ආර්ථික අර්බුදයන් නිසා ජන ජනගහනයෙන් බහුතරය දරුණු ලෙස දුගී භාවයට ඇද හෙළා තිබේ. ලෝක බැංකු දත්ත අනුව දැනටමත් බිලියන 2.8 ක ජනතාවක් අන්ත දුගී භාවයට පත්වී ඇති අතර ඒ ලෝක ජන ජනගහනයෙන් 36% කි. අසංවිධිත ක්ෂේත්‍රයේ බිලියන දෙකක් කම්කරුවන් 80% මේ අර්බුදයට මුහුණ දී සිටිති.

ලෝ පුරා ම මහ බැංකු කටයුතු කරන්නේ එක ආකාරයකටය. ඔවුහු ඩොලර් හා යුරෝ බිලියන ගණන ආර්ථිකයට පොම්ප කරන්නේ රාජ්‍ය හා පුද්ගලික ව්‍යාපාර බංකොලොත් භාවයට පත්ව වීම වලක්වා ගැනීම සඳහාය. බොහෝ ආණ්ඩු තාවකාලික වශයෙන් අයවැය හිඟය අඩු කර දැමීමේ ප්‍රයත්නයක් අතහැර දමා ඇත. විශේෂයෙන්ම අතිවිශාල ලාභ ලබන ආයතන වලින් බදු අය කිරීම අතහැර දමා තිබේ. එසේ ම ජනතාවගේ ණය බර දැඩි ලෙස ඉහළ ගොස් ඇත. ඉහත සඳහන් කළ කරුණු වලට අමතරව අපේ යුගයේ බරපතළ තාක්ෂණික පරිවර්තනයක් සිදු වෙමින් තිබේ. මේ නිසා නිෂ්පාදන ක්‍රියාදාමය මෙන්ම කම්කරු සබඳතා වල ද යම් යම් වෙනස්කම් සිදු වී ඇත. විශේෂයෙන්ම තාක්ෂණික ක්ෂේත්‍රයේ හා අනිත් අතට නිත්‍ය නොවන රැකියා ක්ෂේත්‍රරයේ වර්ධනයක් දක්නට තිබේ. මූලිකව වශයෙන් මෙම පරිවර්තනයන් යොමුවන්නේ පාලනය කරන්නෙත් ලෝකෙ පුරා විසිරී සිටින අති දැවැන්ත සමාගම් සහ දේශපාලන බලයන් කීපයක් විසිනි. ඔවුන්ට කම්කරු පන්තියේ හෝ පොදු ජනතාවගේ උවමනාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මූලික වශයෙන් ඒ අය පිටස්තරයන් ව සිටිති. මානව වර්ගයාට වින කරන ප්‍රධාන තාක්ෂණික අංශ ගණනාවක් අද ධනවාදය තුල ක්‍රියාත්මක වෙමින් පවතී.

- මිලිටරි තාක්ෂණ
- 02 ජාන තාක්ෂණයේ වර්ධනය
- 03 තොරතුරු තාක්ෂණ

අපි එන්න එන්නම මිලිටරිකරණය වන ලෝකයක ජීවත් වන්නෙමු. ඇමරිකා එක්සත් ජනපදය ලෝක ආධිපත්‍යය සඳහා තරගයක යෙදී සිටී. විශේෂයෙන්ම ආර්ථික ක්ෂේත්‍රය තුල චීනය බලවත් තැනකට ඒම වැළැක්වීම සඳහා කටයුතු කරමින් සිටී. මෙහිදී ඇමරිකානු එක්සත් ජනපදයේ ප්‍රධාන සතුරා වන්නේ චීනය හා රුසියාවයි. තියුණු තාක්ෂණික තරගයක් ද, ආක්‍රමණකාරී වෙළඳ යුද්ධයක් ද, පෙන්ටගනයේ මිලිටරි මතවාදයන් නැවත සැකසීම ද, බුෂ් හා ඔබාමා පාලනය යටතේ ගෙන ගිය ත්‍රස්තවාදයට විරුද්ධ යුද්ධය ද රාජ්‍ය අයවැයේ මිලිටරි වියදම් සඳහා දරන අති විශාල ධනස්කන්ධය ද මෙයට සාක්ෂි දරයි. මෙවැනි භූගෝලීය පරිවර්තනයක් සමකාමීව සිදු විය හැකිය. න්‍යෂ්ටික යුද්ධයක් පිළිබඳ අදහස අද වඩ වඩාත් උත්සන්න ව පවතිනු පෙනේ. නමුත් නෂ්ටික යුද්ධයක් ක්ෂණිකව සිදුවීමට ඇති ඉඩකඩ අඩුවුත් රුසියාව විසින් යුක්රේන්‍ය ආක්‍රමණය කිරීමට ගනු ලැබූ තීන්දුවත් සමඟ මෙය සංකීර්ණ තත්වයක් ගෙන ඇති බව පෙනේ. එවන් න්‍යෂ්ටික යුද්ධයක් කරා යන්නට පහසු නොවනු ඇත.

මෙම කරුණු විශේෂයෙන්ම වසංගත තත්වය තුල අති ප්‍රබල තත්ත්වයකට පත්ව අත. ජාන තාක්ෂණය වර්ධනය තුළ ජන ජීවිතයේ බරපතළ වෙනස්කම් සිදු වී ඇති අතර වගාවන් පුද්ගලීකරණය කිරීම, ගොවි ජනතාවගේ ජීවිත අවදානමේ හෙලීම හා ආහාර සුරක්ෂිතතාවය නැති කිරීම සිදු වී තිබේ. විශ්වය පුරා ආහාර නිෂ්පාදනය හා පරිභෝජනය පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාදාමයක් පවතී. අධිතාක්ෂණික මෙවලම් විශේෂයෙන් ජංගම දුරකථන, ගූගල් වැනි සේවාවන් හරහා සිදු කරනු ලබන තොරතුරු හා දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය තුළ මනුෂ්‍ය වර්ගයාගේ පෞද්ගලිකත්වය අහෝසි කරන ක්‍රියාදාමයක් සිදුවෙමින් පවතී. විශේෂයෙන්ම ඩ්‍රෝන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සිදු කරන තොරතුරු සොයා බැලීම් අද බරපතළ ප්‍රශ්නයක්ව ඇත. ඩිජිටල් හැඳුනුම්පතක් ලබා දීම මෙහි එක් අවස්ථාවකි.



2020 වන විට චීනය ඉතා බලගතු තැනකට පත් වී තිබෙණි. එහි නිෂ්පාදන ක්‍රියාවලිය හා අපනයන ක්‍රියාවලිය නව ජවයකින් ඉදිරියට පැමිණෙමින් තිබුණි. භාණ්ඩ අපනයනය කිරීම තුළින් ද, ද්‍රව්‍යමය හා වෛද්‍ය ආධාර ලබාදීම තුළින් ද විශේෂයෙන් ම වැක්සීන් ලබා දීම තුළින් ද චීනය ආසියාව තුළ බලගතු ආකර්ෂණයක් ගන ඇත. ලතින් ඇමරිකාව හා අප්‍රිකා රටවල් සම්බන්ධයෙන් ද තත්වය මෙසේ ය. ආසියාවේ චීනය උත්සාහ කරමින් ඉන්නේ චීනයේ පවතින මෙම තත්ත්වය සමබර කිරීම සඳහා ට්‍රම්ප් යොදාගත් ඉන්දු පැසිපික් උපාය මාර්ග හා ප්‍රාදේශීය ආර්ථික සහභාගිත්වය නමැති මිලිටරි උපායමාර්ගය පැහැදිලිවම චීනය හා ආසියානු රටවල් 12 ක් එල්ල කරගෙන සිදු කෙරේ.

යුරෝපා සංගමය වසංගතය නිසා දරුණු පීඩනයකට ලක්ව ඇත. පන් ලක්ෂයකට වැඩි මරණ, ආර්ථිකය අස්ථාවරභාවය, මූල්‍ය ක්ෂෙත්‍රයන් වඩ වඩාත් වසංගතයන් වෙනුවෙන් යෙදවීමට සිදුවීම බරපතළ ප්‍රශ්නයකි. කෙසේ වෙතත් යුරෝපා සංගමය මහා බ්‍රිතාන්‍යයෙන් ඉවත්වීමත් සමඟ යම් දුර්වලතාවයකට පත්ව ඇත. නමුත් හැම විටම එය ක්‍රියාත්මක වන්නේ යුරෝපා ජාතිකවාදයේ උවමනාවන් මුල්කරගෙන ගොඩනගාගත් බලයන්ත්‍රයක් ලෙසය. එය ලෝකයේ ඇමරිකානු ආධිපත්‍යයට කෙලින්ම එකඟ නොවන අතර ඔවුන් සමග ද යම් යම් ප්‍රතිවිරෝධයන් පවතී.

විශේෂයෙන්ම මෑත භාගය ඇමරිකානු අධිරාජ්‍යවාදය බරපතළ පරාජයක් ලැබුයේ ඇෆ්ගනිස්ථානයේ ය. අවුරුදු විස්සක් පුරා ත්‍රස්තවාදය තුරන් කිරීමේ අරගලය නමින් හඳුන්වපු තිරස්චීන යුද්ධයක් ඇෆ්ගන් ජනතාවට විරුද්ධව ගෙනගිය ඇමරිකානුවන්ට හා යුරෝපීය ජාතීන්ට අවසානයේදී සිදුවූයේ ඔවුන් විසින්ම පලවා හරින ලද තලෙයිබාන්වරුන් ජයග්‍රහණය ලබා දී ඇමෙරිකානු භූමියෙන් විලි ලැජ්ජා නැතිව පිටවී යාමයි. මෙය වනාහි ඇමරිකානු අධිරාජ්‍යවාදය මේ මොහොතේ ලද බරපතළ පරාජයක් ලෙස හැඳින්විය හැකිය. වියට්නාම යුද්ධයෙන් පසු ඔවුන් ලැබූ දරුණු ම පරාජය මෙයයි. මේ තුළ ඇෆ්ගනිස්තානය තුළ නැවත වතාවක් මූලධර්මවාදී බලවේගයන් බලයට පත්වූ බව සැබෑ නමුත් අධිරාජ්‍යවාදය පසුබැසීම් වැදගත් සාධකයකි. අධිරාජයවාදයට කිසිසේත් ම ඇෆගන් ජනතාව ආරක්ෂා කිරීමේ උවමනාවක් නොතිබූ බවක් ඇෆ්ගනිස්තානයේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට ඔවුන්ට උවමනා නොවුන බවත් මින් ඉතාමත් පැහැදිලි වේ. අද වන විට ඇෆ්ගනිස්ථානයේ නැවත වතාවක් මුල්ලා වරුන්ගේ පාලනයට නතු වී ඇති අතර ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ජන ජීවිතය ද ඉතාම අභාග්‍යසම්පන්න ආකාරයට වැනසෙමින් පවති. මේ තත්වය තුළ විශේෂයෙන්ම චීනය හා රුසියාව වර්තමාන ඇෆ්ගන් පාලකයින් ආරක්ෂා කරනුයේ විශේෂයෙන්ම ආසියාව තුළ දේශපාලනය බල සම්බන්ධතාවයේ ඇති අවශ්‍යතාවය නිසා බව පෙනේ. එය අවාසනාවන්ත තත්වයකි. ඇෆ්ගන් ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීමේ අරගලය ආසියාව තුළ විශේෂයෙන්ම ජනතාවගේ එක් වගකීමක් හැටියට අපි කල්පනා කරමු.

1990 පසුව මේ සඳහා තරගකාරීත්වය ඉතා ඉහළ ගොස් ඇත. එහි අංගයක් වශයෙන් පුද්ගලීකරණය හා සමාජයේ සියලු කොටස් ව්‍යාපාරිකරණය කිරීම සිදුවෙමින් තිබේ. ලෝක ධනවාදයේ රාමුව තුළ මේ නව තාක්ෂණයන් යොදා ගැනීම නිසා මීට කලින් ලෝකයේ පැවති නිෂ්පාදන රටාව වෙනස් වී කම්කරුවිකරුවන් රැකියාවෙන් එලියට ඇද වැටී ඇත. බිලියන ගණන් ජනතාව මෙම නව ලිබරල්වාදී විපත්තියට ගොදුරු වී ඇත. කලින් පැවති ඔබාමා පාලනය මෙන්ම බයිඩන් පාලනය ද උත්සහ කරමින් සිටින්නේ පසුගිය කාලය තුළ ඇමරිකාවට අහිමිව ගිය ජාත්‍යන්තර සබඳතා යථා තත්ත්වයට පත්කර ගැනීමට ය. විශේෂයෙන්ම යුරෝපය සමග හා චීනය සමග වඩා සහයෝගයෙන් වැඩ කිරීමට ඔවුහු කල්පනා කරති. නමුත් රිපබ්ලිකන් පක්ෂය වටා ගොනු වී සිටින අන්ත දක්ෂිණාංශික බලවේගයන් එම ක්‍රියාවලියට බාධා කරන බව ද රහසක් නොවේ.

එක් අතකින් අධි තාක්ෂණික හා තොරතුරු තාක්ෂණයට අදාල සමාගම් මහා පරිමානව ආධිපත්‍ය ලබා සිටියත්, විශේෂයෙන්ම එක්සත් ජනපදය, යුරෝපය හා ජපානය ඇතුළු මූල්‍ය බුබුළු ෂෙයා මාර්කට් හා අනිත් මූල්‍ය වෙළෙඳපොළේ ප්‍රශ්න ආදිය නිසා ආර්ථිකය දරුණු පසු බැසීමකට ලක් ව තිබේ. වසංගතය හේතු කොටගෙන බොහෝ ක්ෂේත්‍රයන්වල ලාභ රේට්ටු ඉතා දරුණු ලෙස බිඳ වැටී ඇත.

ආර්ථික ක්‍රියා ක්‍රියාකාරීත්වයේ මේ මන්දගාමී ස්වභාවය හේතු කොටගෙන (2020) සමස්ථයක් ලෙස ගත් විට දළ දේශීය නිෂ්පාදනය 5% කින් අඩු වී ඇත. මෙය 2008, 2009 තත්ත්වයටත් වඩා නරක තත්ත්වයකි. මේ තත්ත්වය ලෝකයේ එක රටකට සීමා වූවක් නොවේ. හැම රටකම පාහේ වසංගතය වරප්‍රසාදයක් කරගැනීමට නොහැකි වූ කොටස්වල නිෂ්පාදනය මිල හා අමුද්‍රව්‍ය සැපයීම බිඳ වැටී ඇත. චීනය පමණක් තමන්ගේ වර්ධන රේට්ටුව ඉදිරි දශක දෙක තුළ යම් පමණකට ඉහළ නංවා ගෙන ඇත. ඇමරිකා එක්සත් ජනපදය 4.1% කින් ද, ජපානය 5.3% කින් ද, යුරෝපා කලාපය 8.3% කින් ද, එක්සත් රාජධානියට 9.8% කින් ද, ඉන්දියාව 10% කින් ද, මෙක්සිකෝව 9% කින් ද, බ්‍රසීලය 5.8% කින් ද, රුසියාව 4.2% කින් ද, චීනය 1.9% කින් ද, පහළ ගොස් ඇත. කෙසේ වෙතත් 2021 ඇමරිකා එක්සත් ජනපදය හා යුරෝපය යම් ප්‍රමාණයට වර්ධනයක් අත් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. නමුත් එය පැහැදිලිවම සමාජ අසමානතාවය හා දුගී බව වැඩි කරමින් සිටී. විශේෂයෙන් ම ලාභ රේට්ටු අඩු වීම හා ධනපතීන් කම්කරු ශ්‍රමය සූරා ගෙන කෑමේ වේගය වැඩි කිරීමට දරන උත්සාහයන් තුළ මේ තත්ත්වය සිදුවේ.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හා ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන අර්බුදය සමාජය තුළ දැඩි ලෙස දුගිභාවය වර්ධනය වීමට බලපා ඇත. ලෝක බැංකු වාර්තා අනුව 2021 වන විට ලෝක ජනගහනයෙන් මිලියන 150 ක් අන්ත දුගී භාවයට වැටෙනු ඇත. දැනට මිලියන 2.8 ක් දුගීභාවයට ලක්ව සිටි. මෙය වනාහි ලෝක ජනගහනයෙන් 36% කි.

ප්‍රධාන ධනපති රටවල මධ්‍යම බැංකු හැම එකක්ම පාහේ ඩොලර් බිලියන ගණන් මූල්‍ය ක්ෂේත්‍රයේ වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා යොදවමින් සිටී. මහා පරිමාණ සමාගම් බංකොලොත් වීමෙන් වළක්වා ගැනීම සඳහා යොදවා ඇත. බොහෝ ආණ්ඩු අය වැය හිඟය අඩු කර ගැනීම සඳහා දරණ උත්සාහයන් අතහැර ඇත. කෙසේ වෙතත් ඉහළ ආදායම් ලබන්නන්ට හා මහා ධනපතීන්ට බදු පැනවීම ඔවුන් පැහැර හැර ඇත. මෙම අර්බුදයන් විශේෂ වාසි ලබාගත් ධනපතින් ප්‍රකෝටිපතියන් බවට පත්වී තිබෙන අතර ඔවුන්ගෙන් බදු අය නොකිරීම රජයේ ප්‍රතිපත්තියයි. මේ නිසා රටවල් තුළ රාජ්‍ය ණය ඉතා ඉහළ ගොස් ඇති අතර නව ලිබරල් ප්‍රතිසංස්කරණ හා සමාජ ආරක්ෂණයන්, කම්කරු නීතිරීති, පුද්ගලීකරණය කිරීම හා පොදු සේවාවන්ට පහර දීම්, පොදු ජනතාවගේ මුදල් දරුණු ලෙස මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට අත් පත් කර ගැනීම රජය හරහා සිදු වේ. ■

# නිදහස් සෞඛ්‍ය සේවාවේ මළගම...

සිරිමල් පීරිස්

සමාජවාදී සැලසුම්ගත ආර්ථිකයක් තිබූ රටවල පමණක් නොව මානව අයතියට දශමයකින් හෝ ගරු කරන රටක නිදහස් සෞඛ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම රාජ්‍යයේ මූලික වගකීමක් ලෙස සලකනු ලබයි.

අධිරාජ්‍යවාදි පාලන තන්ත්‍රයක් යටතේ පවා අප විසින් දිනාගෙන තිබූ නිදහස් සෞඛ්‍ය සේවාව වර්තමානයේ සම්පූර්ණයෙන්ම අහෝසිවන තත්වයක් රා ගමන් කරමින් සිටිනු ලැබේ. පෙර තිබූ තත්වයටත් වඩා වර්තමාන තත්ත්වය විසින් එය තීව්‍ර කර තිබේ.

පර්යේෂණ කිසිදු මිල පාලනයකින් තොරව පෞද්ගලික රෝහල් සඳහා විවෘත කිරීම මෙයට හොඳම උදාහරණයන්ය.

කොවිඩ් 19 සඳහා දෙනු ලබන එන්නත පෞද්ගලිකරණය නොකිරීම එය නිදහස් සෞඛ්‍ය සේවාව මත රදවා තැබීමට ගත්තැත ප්‍රශංසනියයි. එමගින් ගුණාත්මක මෙන්ම විශ්වාසදායි එන්නත්කරණ සේවාවක් ලබා ගැනීමට හැකිවී තිබේ.

සෞඛ්‍ය සේවාවන් පෞද්ගලිකරණය කොට සමාගම් වලට ලාභය ලබා ගැනිමට ............... ගයන ප්‍රතිගාමී පුවත්පත් පැවතීම ද නිදහස් සෞඛ්‍ය සේවාව ආරක්ෂා කරගැනීමට මහත් බාධාවක් වී තිබේ. නිරෝධායනය කොට ලාභ ලැබීමට කොවිඩ් වසංගතය භාවිතා කිරීමට පෙර ඇතැම් පුවත්පත් මෙය හෝටල් භාවිතය හැඳින්වීමට උත්සහ ගත්තේ නොමිලේ ලැබෙන සේවාවක් ලෙසය.

ජනයා පෞද්ගලිකරණය නිසා මෙවැනි පීඩාවකට පත්ව




රාජ්‍ය සේවයේ යෙදුන වෛද්‍යවරුන්ට හා සෞඛ්‍ය සේවකයාට පෞද්ගලික සේවාවේ යෙදීමට අවසර දීම තුලින් සෞඛ්‍ය සේවාව පෞද්ගලිකරණයට භාජනය කිරීමට අතවැනු අතර කොවිඩ් වසංගතය තුළින් පූර්ණ පෞද්ගලික සේවාවකට ජනයා සුරා කෑමට ලක්කිරීමට ඉඩ සලසා ඇත.

රෝහල් තුළ ඖෂධ හිඟය සහ රෝගයන් සඳහා අවශ්‍ය පරීක්ෂණ කිනම් ප්‍රමාණයකින් අවම වී ඇද්ද යන්න නොරහසකි. රෝහල තුළ රෝගියා ප්‍රථිකාර ලැබුවත් පෞද්ගලිකව ගෙන ආයුතු ඖෂධ හා පරීක්ෂණ වාර්තා එමටය. අක්ෂි කාච සහ ස්ටේන්ට් සඳහා උපරිම මිලක් රජය මගින් නියම කළත් මිල පාලනය කිරීමට උත්සහ ගනු ලැබුවත් මිල පාලනයක් ක්‍රියාත්මක නොවන රාජ්‍ය තන්ත්‍රයක් තුළ කිසදු සහනයක් ජනතාවට නොලැබෙන බව අපි අත්දැකීමෙන් දැක ඇත්තෙමු. සෞඛ්‍ය සේවාවේ ගුණාත්මක භාවයේ වර්ධනයක් ඖෂධ නියාමන අධිකාරිය තුළින් ජනයා බලාපොරොත්තු වුවත් එය බොඳවූ සිහිනයක් බවට පත්ව තිබේ. සෞඛ්‍ය අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට ඇතුල් කර ගැනීමේ උත්සාහයක් නොයෙකුත් මාර්ග මගින් ධනපති රාජ්‍යයන් හා සමාගම් ව්‍යවර්ථ කරමින් සිටියි.

කොවිඩ් වසංගතය ජනතාවට ව්‍යවසනයක් වු අතර ධනපති සමාගම් වලට අධික ලාභයක් ගෙන දෙන්නක් බවට පත්කිරීමට රාජ්‍ය පෞද්ගලිකරණ ප්‍රතිපත්තිය ඉවහල් විය. කිසිදු මිල පාලනයකින් තොරව නිරෝධායනය සඳහා රෝහල් භාවිතය, ඇන්ටිජන් හා පි.සී.ආර් ඇති විට පවා කොවිඩ් සඳහා දෙනු ලබන රන්නත පෞද්ගලිකරණය කරන ලෙස කතෘ වාක්‍ය ලියමින් ඉල්ලීමට පවා ඇතැම් පුවත්පත් ඉදිරිපත් විම අතිශයින් කණගාටුවට කරණක් වනු ඇත.

බාහිර රෝගීන් ගෙන් 50% වැඩි කොටසක් පෞද්ගලික ප්‍රථිකාර ලබන තත්වයක් තුළ ඖෂධ මිල 25%කින් ඉහළ දැමීම ජනයාට කිසිසේත් දරාගත හැකි තත්වයක් නොවේ. සත්‍ය වශයෙන්ම මේ හෙයින් ලංකාවේ ජීවත්වන ජනයාගේ ජීවිත කාලයේ උපරිම ආයු කාලය පහළ යනු ඇත. මරණ අනුපාතය ඉහළ යනු ඇත. තවද නිදන්ගත රෝගයන්ගෙන් පෙළෙන්නන්ට ක්‍රමවත්ව හා විධිමත්ව ඖෂධ භාවිතා කිරීමට නොහැකි වීමෙන් ජීවිත කාලය කෙටිවනු ඇත.

ජනයාගේ සෞඛ්‍ය සේවය ආරක්ෂා කිරීමට පෞද්ගලික රෝහල් ආරක්ෂකයන් වශයෙන් ඉදිරියට ආවත් ඔවුන් විසින් ගසාකන රෝගීන් සතු සම්පත් පුදකිරීමට සිදුවීමෙන් ජනයාගේ ආර්ථිකයත් සෞඛ්‍යයක් අහෝසි වී සෞඛ්‍ය සේවා සපයන සමාගම් පමණක් රජවන යුගයක් උදාවෙනු ඇත.

ආහාර මිල ඉහළ යාම, කිරිපිටි හිඟය, ගෑස් හිඟය, ඉන්ධන හිඟය, විදුලිය කැපීම අනියම් මාර්ගයෙන් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා බලපානු ලබන කරුණුය. එබැවින් මූලික මනුෂ්‍ය අවශ්‍යතා රැකගැනිමට ගත යුතු ක්‍රියාමාර්ගයක් සඳහා එක්විම සහ ඒවා ලබාගැනිම රාජ්‍ය තන්ත්‍රයට බලපෑම් කිරිම අප කාගේත් යුතුකමක් හා වගකීමක් පවෙයි. ■

ජවිපෙ උපත.. 3 පිටුවෙන්

නිර්ධන පන්ති විග්‍රහය පූර්ණ වශයෙන් ම නිර්මාක්ස්වාදී සංකල්පයකි. එකී විග්‍රහයට අනුව වියලි කලාපයේ හේන් ගොවිජනයා නිර්ධන පන්තියක් ලෙස හැඳින්විය. ඒ මත දෙකම සිංහල ගැමි තරුණයන් ආකර්ෂණය කරීමට බෙහෙවින් බල පෑ බව ස්ථිරවම දනිමි. ඉහත සඳහන් මත දෙකට අමතරව වෙනත් නිර්මාක්ස්වාදී මතයන් ද තිබූ බව දනිමි. පක්ෂයේ සංවිධාන මූලධර්මයන්ද බෝල්ෂේවික් ස්වරූපයට හාත් පසින් ම වෙනස් විය.

පක්ෂය ආරම්භයේ සිටම "චේ" සංවර්ධනය කළ ග්‍රාමීය ගරිල්ලා අරගලය මෙන් ම කලෝස් ටරිගෙලාගේ නාගරික ගරිල්ලා ෆෝකෝ න්‍යායන් බැහැර කළ අතර, ඒ වෙනුවට විසිරුණු සහ පැතිරුණු අරගල ස්වරූපය ලංකාවට ආදේශ කළේ ය. එය පක්ෂයේ පිළිගත් උපාය මාර්ගය විය. මෙය ගත යුතු මග මූලික පිළිගත් උපාය මාර්ගයක් විය. මෙය ගත යුතු මග මූලික පන්තියෙන්ද හෙලි කළ විධි ක්‍රමය විය.

මූලික පන්ති පහෙන් පසු න්‍යායික කඳවුරු සහ න්‍යායික සන්නද්ධ කාර්යයන් දෙකම පුහුණු කඳවුරු ගණනාවක් ම සිදු විය. අපෝහකය, ඓතිහාසික භෞතිකවාදය, ද්විඝටනාත්මත භෞතික වාදය, ප්‍රතිවිරෝධය, ලෝක විප්ලවීය ව්‍යාපාරයේ අත්දැකීම් මූලික වශයෙන් ම දේශන පන්තිවලට අඩංගු විය.

ඒ කෙසේ වුවද නියත හා නිශ්චිත වශයෙන් ම පක්ෂ සංවිධාන දිශානතිය 71 අප්‍රේල් නැගී සිටීම සනිටුහන් කළ බව විශ්වාසයෙන් යුතුව කීමට හැකි ය.

ඒ අනුව මනෝමූල හා විෂයමූල සාධක පරිණත නොවී තිබියදී, කම්කරු පන්තිය සහ අනෙක් පීඩිත පන්ති අරගලකාරී හා ඒ වෙනුවට සහභාග ධනපති ආණ්ඩුව ගැන ජනතා විශ්වාසය තිබිය දී සන්නද්ධ නැගිටීම සිදු විය. ඉන් පසුව සිදු වූ ධවල භීෂණය මගින් නැගිටීම පාගා දැමිණ. මෙම නැගී සිටීමෙන් අනතුරුව නැවත ප්‍රතිසංවිධානය වූ ජනතා විමුක්ති පෙරමුණ 71 නැගිටීමේ අභාවවාචක අත්දැකීම් නොතකා හැරීම තුළින් 80 දශකයේ අග භාගයේ දී දෙවන විනාශයට ද ගොදුරු වූ බව අපි දනිමු.

ලංකාවේ පැරණි වාමාංශික පක්ෂ හැත්තෑ එක නැගිටීම සෝපාහාසාත්මක ලෙසින් ද, වරෙක සී. අයි. ඒ. ලේබල් ඇලවීමෙන් ද නිග්‍රහයට පත් කළ නමුත්, අද වන විට එම පක්ෂ නැවත නැගී සිටිය නොහැකි තරමට ධනේෂ්වරයට නතු වී ජරාජීර්ණ වී ඇත.

මෙවැනි නැගිටීම සම්බන්ධ ලෙනින් සහෝදරයා දැරූ ස්ථාවරය ඉතා පැහැදිලි ය. 1905 විප්ලවීය සම්බන්ධයෙන් 1917 ජනවාරි 22 දින ස්විස් ජාතික තරුණ කම්කරු සංගමයේ දී කළ දේශණයෙන් පැහැදිලිව දක්වා ඇත්තේ ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් බව ය. වර්ෂ 1825 දී සාර් රුසියාවේ බිහි වූ නරෝද්නිකවාදී විප්ලවීය ව්‍යාපාරය මෙම දේශනයේ දී ඇගයීමට ලක් විය.

එසේ වුවද අද වන විට ජනතා විමුක්ති පෙරමුණ නමින් ම පාර්ලිමේන්තු දේශපාලන කරලියේ වැජඹෙන, ධනේෂ්වරයට එරෙහි සහ පීඩිත ජනතා නැගී සිටීම් ගැන වදනකුදු නොදොඩන සුළු ධනේෂ්වර දක්ෂිණාංශික කණ්ඩායමට පැරණි ජනතා විමුක්ති පෙරමුණේ උරුමක්කරුවන් ලෙස පෙනී සිටිමට කිසිදු සදාචාරයේ අයිතියක් නැති බව අවසන් වශයෙන් කියා සිටිමි. ■

..මෙම ලිබරල් ධනේශ්වර ක්‍රමයේ දැඩි ම බිඳවැටීම ශ්‍රී ලංකාව තුල සනිටුහන් වනුයේ, වාර්ගික යුද්ධය සමඟිනි. මෙම යුද්ධය සමඟින්, ලිබරල් මුහුණුවර මිලාන වී ධනේශ්වර ක්‍රමයේ දේශීය නැගීසිටීමක් ලෙස ජාතිකවාදය සහ හමුදාකරණය ඉදිරියට පැමිණෙන ආකාරය හඳුනා ගත හැකිය. එය පරාජය කල හැකි වාමාංශික දේශපාලනයක් ශ්‍රී ලංකාව තුල නොවීම හේතුවෙන්, මෙම වාර්ගික ජාතිකවාදී දේශපාලනය හමුදාකරණය තෙක් වර්ධනය විය. දකුණේ මෙම ජාතිකවාදය තුල ස්ථානගත වුයේ, හමුදා සොල්දාදුවෙකු ලෙස හෝ ඇඟලුම් කර්මාන්ත ශාලා ශ්‍රමිකාවක ලෙසිනි. එම ජාතිකවාදී ප්‍රතිසංස්කරණ හරහා ගොඩ නැගී තිබූ ආර්ථික ව්‍යුහය විසින් ස්ථාපිත කම්කරු පංතිය තම විමුක්තිය සොයා සුළු ධනේශ්වර ආයතන වන ආගම සහ ධනේශ්වර කළාව වෙත අවධානය යොමුකරන ලදී..



# දැවැන්ත ජනතා නැගිටීමක් අභිමුව..

අරුණී සමරකෝන්

ගෙවෙන මොහොතේ ශ්‍රී ලංකාවේ, නව ලිබරල් වාදී, ආර්ථික ප්‍රතිසංස්කරණයන්ගෙන් පෝෂිත ව, ඉහලට නැගුන කුළුණු අභියස සිට ජනතාවක් ගෝඨාභය ජානාධිපතිවරයා ට ගෙදර යාමට බලකරමින් සිටි. එය ඉහල ධනේශ්වර බුද්ධිමය කුලකය විසින් 'මධ්‍යම පංතියේ ' අර්බුදයක අවස්ථාවක් ලෙස නම් කර ඇත. මෙම ලිපිය ලිවීමේ මුලකම අරමුණ නම්, මේ ගෙවෙන මොහොතේ ශ්‍රී ලංකාවේ ජන නැගීසිටීම හුදෝක්ම පහළ මධ්‍යම පන්තික අර්බුදයකට පමණක් ලඝු කල නොහැකි බවට මගේ පැහැදිලි කිරීම ය.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සිවිල් යුද්ධය ආරම්භයේ සිටම, දකුණේ බහුතර ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගුනේ 'ලිබරල් ධනේශ්වර ආර්ථිකය ' කේන්ද්‍රියව වේ. එම ආරථික ප්‍රතිසංස්කරණ විසින් දේශපාලන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හදුන්වා දුන් අතර, 1978 ව්‍යවස්ථාව යටතේ, 'විධායක ජනාධිපති ක්‍රමය ස්ථාපිත කරන ලදී. එම ධුරයේ මුලිකම අරමුණ නම්, දේශපාලන අස්තාවරත්වයකින් තොරව ආණ්ඩුකරණය සහ සංවර්ධනය පවත්වා ගෙන යාමය. කෙසේ නමුත් මේ ගෙවෙන මොහොතේ, ශ්‍රී ලංකාව තුල, ආණ්ඩුකරන අස්ථාවරත්වය නිර්මාණය කර තිබෙන්නේ ද මෙකී විධායක ජානාධිපති ක්‍රමය විසිනි. එනම්, ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ හා සමවන ලෙස ගමන් කල හැකි දේශපාලන ප්‍රතිසංස්කරණ හදුන්වා දීමට ද, ලිබරල් ධනේශ්වර නියෝජිතයන් අසමත් වී ඇත.

මෙම ලිබරල් ධනේශ්වර ක්‍රමයේ දැඩි ම බිඳවැටීම ශ්‍රී ලංකාව තුල සනිටුහන් වනුයේ, වාර්ගික යුද්ධය සමඟිනි. මෙම යුද්ධය සමඟින්, ලිබරල් මුහුණුවර මිලාන වී ධනේශ්වර ක්‍රමයේ දේශීය නැගීසිටීමක් ලෙස ජාතිකවාදය සහ හමුදාකරණය ඉදිරියට පැමිණෙන ආකාරය හඳුනා ගත හැකිය. එය පරාජය කල හැකි වාමාංශික දේශපාලනයක් ශ්‍රී ලංකාව තුල නොවීම හේතුවෙන්, මෙම වාර්ගික ජාතිකවාදී දේශපාලනය හමුදාකරණය තෙක් වර්ධනය විය. දකුණේ මෙම ජාතිකවාදය තුල ස්ථානගත වුයේ, හමුදා සොල්දාදුවෙකු ලෙස හෝ ඇඟලුම් කර්මාන්ත ශාලා ශ්‍රමිකාවක ලෙසිනි. එම ජාතිකවාදී ප්‍රතිසංස්කරණ හරහා ගොඩ නැගී තිබූ ආර්ථික ව්‍යුහය විසින් ස්ථාපිත කම්කරු පංතිය තම විමුක්තිය සොයා සුළු ධනේශ්වර ආයතන වන ආගම සහ ධනේශ්වර කළාව වෙත අවධානය යොමුකරන ලදී. උදාහරණ ලෙස පිච්ච මල් පුජා කරමින්, රන් ආලේපිත පිළිම සහිත පන්සල් / අසපු වෙත ඇදෙමින් තමන්ගේ ශ්‍රම වේදනාවෙන් මිදීම ඔවුන් බලාපොරොත්තු විය. එසේම, ධනේශ්වර ක්‍රමයේ ගුවන් විදුලි වැඩසටහන් වෙත ඇදෙමින්, තමන්ගේ විනෝදය සෙවීමට උත්සුක විය. මෙවැනි පසුබිමක ලිබරල් දේශපාලන ක්‍රියාකාරිත්වය වන 'වැඩබිමේ අයිතිය ' හරහා, ශ්‍රම සුරාකෑම යම් දුරුකට වලකන ප්‍රතිසංස්කරණ සකස්වූ පසුබිමක් පමණක් ඇති වූ අතර එය පංති විඥානය වර්ධනය සඳහා ප්‍රමාණවත් නොවිය.

එසේම යුද්ධය ද ජාතික ආරක්ෂාව ලෙසට වර්ධනය වෙමින්, සංවර්ධනය වෙනුවෙන් අත්‍යවශ්‍ය බවට තීරණ කරන ලදී. එම යුද්ධයට දකුණේ සමාජයෙන් සැපයිනි. උතුරේ සමාජය තුලද, ජාතික විමුක්තිය ධනේශ්වර ප්‍රතිසංස්කරණ සමඟ සම්බන්ද වූ ආකාරයක් දැකිය හැකි විය. උතුර සමඟ සම්බන්ද විය හැකි පන්ති ව්‍යාපාරයක් ඒ අවදියේ දී නොවූ අතර සමබන්ද වූ ප්‍රමාණය ද උතුරේ සහ දකුණේ ඉහල මාධ්‍ය පංතිය ට පමණක් සීමා වූ ආකාරය දැකිය හැකිය .

මෙම ඉතිහාසය අද නැවත අභිමුක වන අකාරය දැකිය හැකිය. තිස් අවුරුදු යුද්ධ තුලදී උතුරේ ජනයා විවිධ අහිමි කිරීම වෙත විෂය විය. අද පැය 10ක් - 13ක් විදුලිය අහිමි කිරීම් එදා උතුරේ සාමාන්‍ය තත්වයකි. අද රෝහලේ ශල්‍යකර්ම නැවතීම, එදා උතුරේ ජනයා ද මුහුණ දුන් ගැටලුවකි. 2008 පමණ වන විට, ශ්‍රී ලංකා හමුදාව යුද මුක්ත කලාප ලෙස නම් කල පෙදෙස් වෙත නොනවතින කාල තුවක්කු, ෂෙල් වෙඩි එල්ල කරන ලදී. වරක් මට කිලිනොච්චියේ දී හමුවූ කාන්තාවක් පැවසුවේ, සමහර මිනිස්සු මිය ගියේ, රාත්‍රියේ දී, හමුදා ප්‍රහාරයන් ගේ මිදීම වෙනුවෙන් , කැලේ සැඟවීමට යාමේ දී, සර්පයන් දෂ්ට කල පසු, නිසි ප්‍රතිකාර නොලැබීම හේතුවෙන් බවය. මෙහිදී තවත් මතක් කල යුතු කරුණක් වේ . එනම්, මේ ෂෙල් වෙඩි ප්‍රහාර සිදුවන්නේ ධනේශ්වර ආණ්ඩු වූ, ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව අනුග්‍රහයෙන්ය. විශේෂයෙන් ම□ 2001 සැප්තැම්බර 11, දින ඇමරිකා එක්සත් ජනපදයට එල්ල වූ ප්‍රහාරය සමඟ ඇරඹි, 'ත්‍රාසයට එදිරි යුද්ධයේ ' දිගුවක් වීම ප්‍රකාශ කල හැකි වූ වාමාංශික ව්‍යාපාරයක් ලංකාවේ නොවිය.

මේ සියල්ල ඓතිහාසික කරුණු වේ. මේවා මග හැර විප්ලවීය නැගිටීම් ගැන කතා කල නොහැක. අද දකුණ ට සිදු වී ඇත්තේ, ජාතිකවාදය හරහා ගොඩ නැගී හමුදාකරණය සමඟ වූ ධනේශ්වර ක්‍රමයේ අර්බුදය වෙත මුහුණ දීමටය. එම අර්බුදය උතුර තුල විශාල විනාශයක් සිදුකරන ලදී. උතුරේ දී මෙන්ම දකුණේ දී ද මේ අර්බදය හරහා වඩාත්ම මර්දනයට ලක්වන සහ පිඩනයට ලක්වන ප්‍රජාව නම් ශ්‍රමය හැරුණු විට කිසිදු ඉපයීමේ මාර්ගයක් නොමැති වූ ජනතාව වේ. ඔවුන් නව කම්කරු පන්තිය ලෙස මම නම් කරමි. එම කම්කරු පන්තිය, ගෙවීමේ ක්‍රමයට, ජිවත් වන අතර , මාසික වැටුප, නව ලිබරල් ජිවන පිළිවෙත් පවත්වා ගැනීමට භාවිතා කරයි. ඔවුන්, නිදහස් වෙළඳ කලාපයේ සිට වානිජකරණ වූ බැංකු ක්ෂේත්‍රය දක්වා විහිදී ඇති බවට මගේ යෝජනාව වේ. මේ කම්කරු පන්තිය, නව ලිබරල් යෝජනා හේතුවෙන් අරබුදයට ගොස් ඇත. එම අර්බුදය තුල ඔවුන් තව දුරටත් මර්දනයට ලක් වීමට ඉඩ තබන්නේ ද නැතිනම් විකල්ප දේශපාලනයක් වෙත ප්‍රවේශ වන්නේ ද යන්න වාමාංශික දේශපාලනය විසින් තීරණය කල යුතුය.

මෙම නව කම්කරු පන්තිය විසින්, ජාතිකවාදී ආර්ථිකය

8 වන පිටුවට

# අසනි

**495, මාකොළ උතුර, මාකොළ.**

**දුරකතන:** 077 9053016 / 077 7035167


## බංකොලොත් රාජ්‍යක අවසානය..

මුළු මහත් රටම වෙළාගත් අති දැවැන්ත විරෝධතා රැල්ලක් සුනාමියක් දක්වා වර්ධනය වෙමින් තිබෙන අවස්ථාවක 'අසනි' සැර පාලකයින්ට දැනෙන බවක් තාමත් විද්‍යමාන නොවේ. ජනාධිපතිවරයා තැන් තැන් වල ලගිමින් තමන් තාමත් 'හොඳින්' සිටන බව, 'හොඳින්' කරන බව රටට කියන්නට දුර්වල උත්සාහයක යෙදී සිටන බව පෙනේ. තමන් කළ කාර්යයන් අසාර්ථක බව තමන්ම පිළිගෙන ජනතාවගෙන් සමාව අයැදින විට රටේ ජනයා දිකොනින් සිනා සෙන බව ඔහු නොදන්නා සෙයකි. ගෙවියා, කම්කරුවා පටන් ඒ හැමකෙක්ම මේ පිළිබඳව ඔහුට කියාදුන්නද තඹ පයිසෙකට නොගත් ඔහු අද රටට ආයාචනය කරන්නේ තවත් ඔහුට සහය දෙන ලෙසය. එයට මේ රටේ දෙකෝටියකට වැඩි මහජනයා කිසිසේත් සූදානම් නැත.

මේ නැගී දිදුලන ගිනිදළු සෙමින්, පරිස්සමින් පරිහරණය නොකළොත් අපි අපිම දැවී අළු වී යන්නට ඉඩකඩ සැලසේ දැයි මොහොතකට කුකුසක් වැඩේ. එදා අරාබි වසන්තතය වැඩී දළු ලා ආ මුත් කෙළවර යලි පාලකයින්ටම වාසිදායක වූ බව ඉතිහාසය සක්ෂි දරයි. මේ රටේ ද '71 වගේම 88-89 ආදී ලෙසින් ද උතුරේ නැගිටීම් හැටියට ද මතු වූ කැරලි අවසාන වූයේ ධනේශ්වර පාලකයින්ගේ අත ශක්තිමත් වීමෙන් නොවේද?

ඊට හේතු පාදක වූ කාරණා කවරේද..?

මේ සංවිධාන රටට පාපොච්චාරණයක් කලේ..ද? මේ සියල්ලත් අප හමුවේ පවතින ප්‍රශ්ණ ගත කරුණුය. අප විසින් වරද්දා ගත්තේ කොතැනද..? කම්කරු පංති බලමුළු ගැන්වීමෙන් තොරව හුදෙක් තරුණ බලවේග පමණක් රටක බලය ලබාගත් තැනක් වේද?. ඇෆ්ගනිස්ථාන් ඉරණම අපට යමක් කියාදෙන බව සිහියේ තබා ගැනීම උචිතය. අදටත් අපේ කම්කරු පංතිය මේ අරගලයේ දී කොයිබටදැයි සොයා බැලීම වටී. වරාය, දුම්රිය, තැපැල්, විදුලිය තාමත් පැහැදිළි හඬක් නැත. වර්ජන කසු කුසු මැද ගුරුවරු ලෙඩ නිවාඩු දැමීමේ කටයුත්තකින් වීදි බැසීමට සූදානම් බව පෙන්වා තිබේ. සෙස්සන් ද ක්‍රමයෙන් සටන් බිම ආක්‍රමණය කරනු ඇතැයි හඟිමු. රටේ පවතින මේ අස්ථාවර තත්ත්වය, ණය අර්බුදය, බඩුමිල ඈ දහසක් දේ ගැන යළි යළි ලියා ඔබ වෙහෙස කරන්නට අපේ බලාපොරොත්තුවක් නැත. අපේ අපේක්ෂාව ඉක්මනින්ම වමේ ස්වාධීන බලයක් ගොණු වී ජයග්‍රහණය තෙක් ගමන් කිරීම සිදුවිය යුතු බවයි.

අපි ඒ සඳහා පෙළ ගැසෙමු.

**'අසනි' හැකි හැම ආකාරයකින් ම අරගලයේ කොටස්කරුවෙකු ලෙස කැපවී සිටින බව ශපථ කරමු..!**

**දැවැන්ත..** 7 පිටුවෙන්

වෙත කරන අභියෝගය, මෙම ආණ්ඩුව විවිධ ස්වරූපයෙන් මර්දනය කිරීමට උත්සහා කරමින් සිටි. නිදසුනක් ලෙස, පේරාදෙණිය විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව විසින් සාමකාමීව සිදුකරන ලද පාගමන වෙත ගලහා මංසන්දියේ දී එල්ලවන ප්‍රහාර සජීවීව විකාශය කරනු ලැබුවේ එම ප්‍රහාරයන් ගේ ම විනිදිතයකු විසිනි. එම කඳුළු ගෑස් ප්‍රහාර හමුවේ, විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨයට දිව යන ශිෂ්‍ය ප්‍රජාව, තම දෑස් සොදාගනු ලැබුවේ, කොළපැහැති වූ පොකුණේ ජලයෙනි. කඳුළු ගෑස් වෙනුවට, ෂෙල් ප්‍රහාර එල්ල කිරීම් උතුරේ සිදුවූ අතර , ජනතාව ජීවිතය රැකගැනීම වෙනුවෙන් බංකර් වෙත දිව ගිය අයුරු සිහි කැඳවියී

මෙසේ කඳුළු ගෑස් කමින් සිදුවන විරෝධතා දැක්වීම් , මධ්‍යම පන්තියේ අර්බුදයක් ලෙසට පමණක් හුවා දැක්විය නොහැකිය. මේ විරෝධතා හොදින් විමර්ශනය් කිරීමේ දී, ජනප්‍රිය කතාව 'GO HOME GOTA' වුව ද ඒ තුල ගෝටා ඇතුළු ජාතිකවාදීන් විසින් රෝපණ කළ දෘෂ්ටිවාදය ට විරෝධයක් ඇතිවී ඇත. උදාහරනයක් ලෙස, ජනප්‍රිය හාමුරුදුරු චරිත මෙම අවකාශයන් ගෙන් පලවා හැරීම ; දරුවන් ද සමඟ විරෝධය පෑම වෙත පැමිණීම ; හැලි වලන්වලින් පිටවන ශබ්ද විරෝධය; සාමාජ මාධ්‍ය හරහා වන විරෝධය; විරෝධතාව වෙත වන නීතිමය පහසුකම් සැලසීම .

මේ සියල්ල තව දුරටත් එක පංතියක අර්බුදයක් රැක ගැනීමක් ලෙසට ම පමණක් නිර්වචනය කල නොහැකිය. එය නව පංතියක ආරම්භයක් වේ. එසේම නව විරෝධතා සංස්කෘතියක ආරම්භය; භාෂාව නව ආරක් ගැනීම. වඩාත්ම , එම භාෂාව ජාතිකවාදියට එදිරි වන ආකාරයක් දැක ගත හැකි වීමය. මේ තමා ඉරිදියේ දී විප්ලව සිදුවිය හැකි ආකාර වනු ඇත්තේ. එය තව දුරටත්, මගේ මිතුරිය අනුෂ්කා ගේ වදනින් ම පවසන්නේ නම් 'මැනුවල් එකක් හරහා තීරණයව ' සිදු නොවෙනු ඇත.

ලිපිය අවසාන කරමින්, මා අවධාරණය කරනුයේ, මෙය නව පංතික් විසින් නව දේශපාලන ධාරාවක් වෙනුවෙන් සංවිධායන වීමක් ලෙස භාරගත යුතුය. එය එලෙසම ඉතිහාසය තුල ද සටහන් විය යුතුය. මෙම නැගී සිටීමේ දී ස්ත්‍රීන් ගේ දායකත්වය නොසලකා හැරිය නොහැක. දරුවන් ද සමඟ මෙම අරගලය වෙත එක් වූ ස්ත්‍රීන් විරෝධතා පෑම විවිධාකාරයෙන් සිදුකළ ආකාරය දැකගත හැකි විය. එම ස්ත්‍රීන් විවිධ තලයන් නියෝජනය කරන ආකාරය ද දැක ගත හැකිවිය. මෙම නව පන්තික දේශපාලනය ආමන්ත්‍රණය වෙනුවෙන් වාමාංශික දේශපාලනයක් ගොඩ නැගීම අත්‍යවශ්‍ය වන අතර එම දේශපාලන තුල දකුණු ආසියානු කලාපය සමඟ හෝ අවම වශයෙන් සහයෝගිතා සම්බන්දයක් ගොඩ නැගිය යුතුය.■

**මැයි දිනයේ..** 1 පිටුවෙන්

ගණන ඉක්මවා යමින් තිබෙන බව පෙනේ. ඒ තුළ කම්කරු පංතිය ඇතුළු පීඩිත ජනතාවගේ ජීවන මට්ටම් කඩා වැටීමක් නිසා සමස්ත ජීවන පැවැත්මට මරණීය අනතුරු එල්ල වී ඇත. මේ මඟින් ඇතිවිය හැකි ගැඹුරු කැලඹිලිකාරි පරිසරයත් සමඟ ලෝකය පුරා කම්කරු පංතිය ඇතුළු බහුජනතාව වැඩ වර්ජන වලට හා බහුජන නැගිටීම් වලට යොමුවන ඇත.

ඉතිහාසයේ ඉතුවන මේ දේශපාලන අන්තර් ජාතික හැඩ ගැසීම් 1886 ඇමරිකාවේ චිකාගෝ නුවර කම්කරු පංතිය දිවි පුදා ලබාගත් ඓතිහාසික ජයග්‍රහණයන් හා බද්ධකර ගනිමින් පන්ති අරගලයට අන්තර් ජාතික දේශපාලන ඉදිරි දර්ශනය සැපයිය යිතු අවධියකට අපි පැමිණ තිබේ.

පීඩකයාට එරෙහිව පීඩිතයාගේ නැගී සිටීම පංති අරගල ඉතිහාසය වන නිසාම, මේ දැවැන්ත ආර්ථික අර්බුදය හමුවේ ප්‍රාග්ධන හිමි ගෝලීය බලවතුන්ගේ ආධිපත්‍යයට විරුද්ධව මතුවන කම්කරු පංති අරගලයට මග පෙන්වීම සඳහා ගැඹුරු දාර්ශනික කතිකාවතකට මුල පිරීමට අපි බලාපොරොත්තුවේ.

**ඒ සඳහා ලාංකේය පංතිය හමුවේ සංක්‍රමණීය යෝජනා මාලාවක් අපි අවධාරණය කරමු.**

- රාජ්‍ය සේවකයන් දොට්ට දැමීමේ කුමන්ත්‍රණකාරී ගැසට් නිවේදනය වහා අවලංගු කිරීම.
- වෘත්තීය සමිති අරගල අධිකරණ නියෝග මගින් මර්දනය කිරීම නැවැත්වීම.
- බඩු මිල, ප්‍රවාහන ගාස්තු, විදුලිය හා ජල ගාස්තු අඩු කිරීමට බල කිරීම.
- වෘත්තිය සමිති, මාධ්‍ය ආයතන බිය ගන්වමින් කරනු ලබන මර්දනයන් වහා නැවැත්විය යුතුය.
- ඇඟලුම් කර්මාන්ත ඇතුළු පුද්ගලික අංශයේ රැකියා අහිමිකරන කම්කරුවන්ගේ ජීවිත සුරක්ෂිත කරන ප්‍රමාණවත් වන්දියක් වහා දැමීම.
- ඊනියා ප්‍රතිසංස්කණ නමින් විදුලි බල මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන පුද්ගලික කරණය කිරීම නතර කිරීම.
- ජාතික ප්‍රශ්නයට ස්වයංතීරණ අයිතිය මත වහා විසඳුම් ලබා දීමට බලකරන කම්කරු පංතියේ එක්සත්කමට අපි මුළ පිරීමට යෝජනා කරන්නෙමු.

ඉහත ඉල්ලීම් වෙනුවෙන් ප්‍රජාත්‍රන්ත්‍රවාදි සාකච්ඡාවකට මුල පිරීම වහා ආරම්භ කළ යුතුය. ඒ සඳහා වැඩපල මට්ටමේ කම්කරු නියෝජිතයින්ගේ ජාතික සමුළුවකට සුදානම් වීමේ යොමුවකට වහා පියවර ගත යුතු බව අවධාරණය කරන්නෙමු.

ඉහත අවධාරණය මත මෙවර මැයි දිනය සැමරීමට වාමාංශික හා වෘත්තිය සමිති එකමුතුවට මුල පිරීමට අපි තීරණය කරනු ලැබීය.■

## අසනි කව් ගී..

### ගෝටා පෝඩා...!

*'ගෝ හෝම් ගෝටා'*
*රට පුරාම ඝෝසා*
*උතුරු කරේත් පෝඩා*
*ගෝ ගෝටා පෝඩා*

*නස්පැත්තිය උනේ රටට*
*විසඳුම් ඇත අපේ අතම*
*එළවන්නට හොර දෙටුවන්*
*යමු අපි පෙරමුණටම*

*කම්කරු බල ඇණි ගන්වා*
*යොවුන් සවිය කුළු ගන්වා*
*ගොවි ජනතා බලවේගේ*
*ගුරු සටනින් ජය බිම වෙත*

*නගමු ..! නගමු ..!! ජය කේළි*
*සැදී බැදී ජන පේළි*
*ලක් දෙරණට ජය භේලි !*
*ජය භේලී!!*

ඇහැළියගොඩ, අඟුරුවාමුල්ල, පදිංචි දේව මහින්දදාස වන මා විසින් ඇහැළියගොඩ, මිහිඳු ග්‍රැෆික්ස් ආයතනයේ මුද්‍රණය කරන ලදි.